# තරණය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2025 - පළමු කලාපය

## නව වසරේ ආරම්භය

“ක්ලීන් ශ්‍රී ලංකා’’ (Clean Sri Lanka) ජාතික වැඩසටහන සමඟ 2025 නව වසරේ වැඩ ඇරඹීම ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් 2025.01.01 දින සිදු විය. මෙහිදි ආයතන පරිශ්‍රය තුළ ජාතික ධජය ඔසවා, කිරි ඉතිරවීම සිදුකළ අතර “පොහොසත් රටක් ලස්සන ජිවිතයක්” ගොඩනැගිම සඳහා Clean Sri Lanka ජාතික වැඩසටහනට සහය විමේ ප්‍රතිඥාව ලබා දීම, මහා සංඝරත්නය විසින් ආයතන කාර්යය මණ්ඩලයටත්, රට වැසියන්ටත් සෙත් පතා පිරිත් සජ්ඣායනාවක් ද සිදු කිරීම හා රුක් රෝපණ වැඩසටහනක් ද පවත්වන ලදි.








## “Clean Sri Lanka ජාතික වැඩසටහන

“පොහොසත් රටක් ලස්සන ජීවිතයක්” ගොඩනැගීම සඳහා “ක්ලීන් ශ්‍රී ලංකා’’ (Clean Sri Lanka) තේමා පාඨය මූලික කරගනිමින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂගේ සම්පත් දායකත්වයෙන් කාර්යය මණ්ඩලය දැනුවත් කිරිමේ වැඩසටහනක් 2025.01.09 වන දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලදී.






## ගම් සංවර්ධන වැඩසටහන උදෙසා.......

2025.01.08, 09 හා 10 දිනයන්හි ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සිසිර කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ නිලධාරින් සහ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරින් එක්ව ගම් සංවර්ධන වැඩසටහන සැලසුම් කරන ලදී.





# 2024 ක්‍රියාකාරි සැලැස්මට අදාළ පර්යේෂණ ඉදිරිපත් කිරිම

2024 වර්ෂයේ සිදු කරන ලද පර්යේෂණවල ඉදිරිපත් කිරිම් 2025.01.16 වන දින ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේදී අතිරේක ලේකම් (සංවර්ධන) හේමා පෙරේරා මහත්මියගේ මූලිකත්වයෙන් පැවැත්විණි. මේ සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පුද්ගලික ලේකම් වසන්ති මහත්මිය, ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මේ සඳහා සම්බන්ධ වන ලදී. මහනුවර දිස්ත්‍රික්කයේ "එළවළු ගොවියන්ගේ නිෂ්පාදන හා අලෙවි ගැටළු" පිළිබඳ සමීක්ෂණය සංවර්ධන නිලධාරී පී.බී.ඩී.වැත්තෑව මහතා ද, "ග්‍රාමීය කෘෂි කර්මාන්තයේ වර්තමාන තත්ත්වය හා එය ග්‍රාම සංවර්ධනය කෙරෙහි සිදු කර ඇති බලපෑම" පිළිබඳ අධ්‍යයනය පුහුණු හා පර්යේෂණ නිලධාරී එස්.එම්.යූ.බී. සමරකෝන් මහතා හා "විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සිටින පවුල් මුහුණ දෙනු ලබන සමාජ, ආර්ථික ගැටලු" පිළිබඳ අධ්‍යයනය සංවර්ධන නිලධාරී එච්.එම්.පී.ඩී.දයාරත්න මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදී.






## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරිම පිළිබඳ අධ්‍යනය දිස්ත්‍රික්ක පුරා ......

### හබරවැවට හා කුරුන්දෑවට ...............

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම මේවනවිටත් ක්‍රියාත්මක කිරිමට සැලසුම් සකස් කරමින් පවතී. උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ හබරවැව ග්‍රාම නිලධාරී වසම හා ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කුරුන්දෑව ග්‍රාම නිලධාරී වසම සඳහා සකස් කළ ග්‍රාම සංවර්ධන සැලසුම් ප්‍රජාවගේ සැබෑ අවශ්‍යතාවය ද යන්න ප්‍රජාවගේ සජීවී සහභාගිත්වයෙන් යුතුව පෙළගස්වන ලදී. අදාළ ව්‍යාපෘති අධ්‍යනය කර සැබෑ අවශ්‍යතාවය නිරික්ෂණය කිරිම සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්), ග්‍රාමිය සංවර්ධන කාර්යංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම් ඇතුලු එම කාර්යාලයේ නිලධාරින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ ඇතුලු නිලධාරින්, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරින් සහ බාහිර ආයතන නිලධාරින් මේ සඳහා සම්බන්ධ වන ලදී.











## අරණායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට…………

අරණායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගංතුන මැදගම ග්‍රාම නිලධාරී වසම සඳහා සකස් කර ඇති ග්‍රාම සංවර්ධන සැලසුම් ප්‍රජාවගේ සහභාගිත්වයෙන් පරික්ෂා කිරිම 2025.02.11 වන දින සිදු කරන ලදී. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නන්ද බණ්ඩාර මැතිතුමා, ප්‍රාදේශිය ලේකම් ඇතුළු කාර්යාලයීය නිලධාරීන්, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) පී.ඩී.කුමාර මහතා සහ හා ග්‍රාමිය සංවර්ධන කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු හා පර්යේෂණ නිලධාරී සිරිසේන මහතා සහ බාහිර ආයතන නිලධාරින් ද මෙම අධ්‍යයනය සඳහා සහභාගි විය.









## අංකන්දට හා ශ්‍රියාගමට ...................

මාතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අංකන්ද ග්‍රාමනිලධාරි වසම සහ පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ශ්‍රියාගම ග්‍රාම නිලධාරි වසම සඳහා සකස් කර ඇති ග්‍රාමසංවර්ධන සැලසුම් ප්‍රජාවගේ සහභාගිත්වය ද සමග 2025.02.14 වන දින අධ්‍යයනය කරන ලදී. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම්, අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන ඇතුළු එම කාර්යාලයේ නිලධාරින්, මාතලේ ප්‍රාදේශිය ලේකම් ඇතුළු එම කාර්යාලයේ නිලධාරින්, පාතහේවාහැට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ ඇතුළු ක්ෂේත්‍ර නිලධාරින්, ග්‍රාමසංවර්ධන කාර්යංශයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා පිළිමතලාව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ස්ථානභාර නිලධාරී ඇතුළු නිලධාරින් රැසක් ද මේ සඳහා සම්බන්ධ විය.









## යක්දෙහිවල ග්‍රාම නිලධාරී වසමට ...................

ඉඹුල්පේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ යක්දෙහිවල ග්‍රාමනිලධාරී වසම සඳහා සකස් කර ඇති ග්‍රාම සංවර්ධන සැලසුම් පරික්ෂා කිරිම සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයක් 2025.02.21 දින සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී එල්.කේ.ආර්.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා, ප්‍රාදේශිය ලේකම් ගයනි රේණුකා මහත්මිය ඇතුළු එම කාර්යාලයේ නිලධාරීන්, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාතයාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) කුමාර මහතා, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රදිප් මහතා හා බාහිර ආයතන නිලධාරින්ද සම්බන්ධ විය.









## සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ බැදි වැවට........

2025.02.27 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ බැදිවැව වසමේ ග්‍රාමිය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා හඳුනාගත් සංවර්ධන යෝජනා නිරික්ෂණය කිරිම සිදු කරන ලදී. මේ සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ සහ ග්‍රාමිය සංවර්ධන කාර්යංශයේ නිලධාරින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, මහවැලි අධිකාරියේ නිලධාරින්, ප්‍රාදේශිය සභා නිලධාරින් සහ පාසලේ විදුහල්පති ද මෙ සඳහා සම්බන්ධ විය.











## ආයතනවල වෙබ් අඩවි සංවර්ධනය උදෙසා ............

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සාකච්ඡාවක් 2025.02.28 දින අමාත්‍ය කාර්යාලයේදී පවත්වන ලදී. ගරු අමාත්‍ය උපාලි පන්නිල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සාකච්ඡාව සඳහා අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම ආයතනවල මාධ්‍ය අංශයේ නිලධාරින් සම්බන්ධ විය. ආයතනවල පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි සංවර්ධනය කළ යුතු ආකාරය හා නිලධාරින් මුහුණපාන ගැටලු මෙහිදි සාකච්ඡා කරන ලදී. සාකච්ඡාව අවසානයේදී රුහුණු විශ්ව විද්‍යාලයේ දේශක කෝකිල රාමනායක මහතා ZOOM තාක්ෂණ ඔස්සේ වෙබ් අඩවි සම්බන්ධ දැනුවත් කිරිමක් ද සිදු කරන ලදී.









# ග්‍රාමසංවර්ධන සැලසුම් සකස් කිරිම සම්බන්ධව පුහුණුකරුවන් පුහුණු කිරිමේ (TOT) වැඩමුළුව

2025.03.14 වන දින ග්‍රාමසංවර්ධන සැලසුම් සකස් කිරිම සම්බන්ධ පුහුණුකරුවන් පුහුණු කිරිමේ දෙදින නේවාසික වැඩමුළුව පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදි ආරම්භ කරන ලදී. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අමාත්‍ය ආචාර්යය උපාලි පන්නිලගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩමුළුව සඳහා අමාත්‍යාංශ ලේකම් මලර්මදී ගංගාධරන් මහත්මිය, අතිරේක ලේකම් නාලිකා පියසේන මහත්මිය, ග්‍රාමීය සංවර්ධන කාර්යංශයේ අධ්‍යක්ෂ ජනරාල් සිසිර කුමාර මහතා, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය, පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂකවරුන්, ගම්පහ, කළුතර, කොළඹ, කුරුණෑගල, පුත්තලම, ගාල්ල, මාතර, හම්බන්තොට, අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, මාතලේ, මහනුවර, වව්නියාව, අම්පාර, මඩකලපුව, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය, මන්නාරම, යාපනය, මුලතිව් යන දිස්ත්‍රික්ක වලට අදාළ සහකාර අධ්‍යක්ෂකවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් ද මේ සඳහා සම්බන්ධ විය.


















**පුහුණුවේ සම්පත් දායකත්වය ....................**

ග්‍රාමසංවර්ධන සැලසුම් සකස් කිරිම සම්බන්ධ පුහුණුකරුවන් පුහුණු කිරිමේ දෙදින නේවාසික වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය පේරාදේණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යය ධම්මික හේරත් මහතා, ජේෂ්ඨ කථීකාචාර්යය හා අචාර්යය ප්‍රියදර්ශනී ප්‍රේමරත්න මහත්මිය, ජේෂ්ඨ කථීකාචාර්යය කුමාරි තෝරදෙණිය මහත්මිය, ජේෂ්ඨ කථීකාචාර්යය හා ආචාර්යය එස්. සුහසිංහ මහත්මිය හා ජේෂ්ඨ කථීකාචාර්යය තුෂාර කමල්රත්න මහතා විසින්ද ලබා දෙන ලදී.











**පුහුණුවේ නිමාව ....................**

ග්‍රාමසංවර්ධන සැලසුම් සකස් කිරිම සම්බන්ධ පුහුණුකරුවන් පුහුණු කිරිමේ දෙදින නේවාසික වැඩමුළුව 2025.03.15 දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය විසින් ස්තූති කථාවෙන් පසුව නිමා කරන ලදී.









## ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කාර්යය මණ්ඩල සාකච්ඡාවක්.....

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් නාලිකා පියසේන මහත්මියගේ ප්‍රධානත්වයෙන් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කාර්යය මණ්ඩල සාකච්ඡාවක් 2025.03.20 වන දින බොරැල්ල ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදි. මෙහිදි 2025 වසරට අදාළ ක්‍රියාකාරි සැලැස්ම ඵලදායි හා කාර්යක්ෂමව ඉටු කළ යුතු ආකාරය හා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාළ සංවර්ධන යෝජනා සමාලෝචනය සිදු කරන ආකාරය හා නිලධාරින්ගේ ගැටළු ද සාකච්ඡා කරන ලදී.







## 2025 අපෙන් ඔබට........

- සමාජ සජීවීකරණය
- ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය
- ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය
- ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධනය
- සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය
- ප්‍රජාමූල සංවිධාන කළමණාකරණය
- පුහුණු වැඩසටහන් සැලසුම්කරණය හා කළමණාකරණය
- විපර්යකාරක පුහුණුකරු පුහුණුව


**උපදේශකත්වය**

තිළිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

**විද්‍යුත් මාධ්‍යගතකරණය**

චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය

**සංස්කාරක**

එච්.එම්.ජී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා
පර්යේෂණ ආයතනය